සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - I

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 01 යි.

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

● ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස් ඉර මත ලියන්න.

(01) ජල ගෝලයෙන් ............................................ ක් පමණ සාගර ජලය වේ. (97.5% / 79% / 71%)

(02) පෘථිවි වායුගෝලයේ ඉහළින් ම ඇති ස්ථරය හඳුන්වනු ලබන්නේ ........................ ගෝලය ලෙස ය. (මෙසෝ / පරිවර්ත / තාප)

(03) ශ්‍රී ලංකාවේ තෙවැනි වගාවක් ලෙස දිවයිනේ සෑම ප්‍රදේශයක ම ........................ වගාව ව්‍යාප්ත වී ඇත. (තේ / රබර් / පොල්)

(04) ජීවීන්ගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලිය ........................................ ට අයත් සිද්ධියකි.
(වායුගෝලය / ජලගෝලය / ජෛවගෝලය)

(05) ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල් ම අදහස් ඉදිරිපත් කරනු ලැබුවේ ................................................ විසිනි.
(ඇරිස්ටෝටල් / තෝන්ත්වේට් / ඔස්ටින් මිලර්)

(06) වායු ගෝලයේ අඩංගු වායු වර්ග අතරින් 21% පමණ ඇත්තේ ................................................ වායුවයි.
(නයිට්‍රජන් / ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ්)

(07) මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක .................................. වගාවට වඩාත් ප්‍රසිද්ධ ය. (කෝපි / කජු / පැඟිරි)

(08) උතුරු ඇමරිකාවේ පිහිටි විශාලතම කඳුවැටිය ...................................... නම් වේ. (ඇන්ඩීස් / රොකි / ඇට්ලස්)

(09) 1 : 50 000 ක ලක්ෂණ සිතියමක වී වගාව දක්වා ඇත්තේ ........................ පැහැයෙනි. (කහ / කොළ / නිල්)

(10) ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව යටතේ රාජ්‍ය මුහුදු ප්‍රදේශය වෙරළේ සිට නාවික සැතපුම් ........................ දුරට විහිදේ.
(12 / 200 / 24)

● ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

(11) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගාවන් තේ මිල දී ගන්නේ මැද පෙරදිග කලාපයයි. (නි / වැ)

(12) වාහන එකලස් කිරීමේ ප්‍රධාන කර්මාන්ත ශාලාව පොල්ගහවෙල ප්‍රදේශයේ පිහිටා ඇත. (නි / වැ)

(13) රබර් වගාවේ ව්‍යාප්තිය සඳහා ලවණ මිශ්‍ර වැලි පස හේතු වී තිබේ. (නි / වැ)

(14) එක් ප්‍රමුඛ කරුණක් දැක්වීම සඳහා පමණක් තේමා සිතියම් නිර්මාණය කර ඇත. (නි / වැ)

(15) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කහටගහ සහ කොලොන්ගහ යන පතල්වලින් උසස් වර්ගයේ ධමනි මිනිරන් ලබා ගැනේ. (නි / වැ)

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා නිවැරදි ලෙස ගැළපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

(16) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පර්යේෂණ ආයතන කිහිපයක් "අ" තීරුවේ සඳහන් වන අතර එම පර්යේෂණ ආයතන සම්බන්ධ වගාවන් "ආ" තීරුවේ දක්වා ඇත. එය නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | මාතලේ | A - | රබර් |
| 2. | අම්බලන්තොට | B - | සුළු අපනයන බෝග |
| 3. | තලවකැලේ | C - | වී |
| 4. | අගලවත්ත | D - | තේ |

(1) ABCD (2) BCAD (3) BCDA (4) CBAD (............)

(17) "අ" තීරුවේ දක්වා ඇති සංචාරක කලාපවලට අදාළ නගර "ආ" තීරුවේ දක්වා ඇත. එය නිවැරදිව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | පුරාණ නගර | A - | හික්කඩුව |
| 2. | දකුණු වෙරළබඩ ප්‍රදේශය | B - | අනුරාධපුරය |
| 3. | මහ කොළඹ කලාපය | C - | නුවරඑළිය |
| 4. | මධ්‍යම කඳුකරය | D - | මීගමුව |

(1) ACDA (2) BADC (3) BDAC (4) CABD (............)

(18) "අ" තීරුවේ රටවලට අයත් යකඩ හා වානේ මධ්‍යස්ථාන "ආ" තීරුවේ දක්වා ඇත. ඒවා නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | එක්සත් රාජධානිය | A - | යූරල් කලාපය |
| 2. | රුසියාව | B - | ලැන්කෂයර් ප්‍රදේශය |
| 3. | ජපානය | C - | තන්ෂුවාං ප්‍රදේශය |
| 4. | චීනය | D - | නගෝයා කලාපය |

(1) BADC (2) ABDC (3) BCDA (4) CBAD (............)

(19) ශ්‍රී ලංකාවේ වාණිජ වගා බෝග කිහිපයක් "අ" තීරුවේ සඳහන් වන අතර ඒවා වගා කිරීමට අවශ්‍ය වර්ෂාපතන ප්‍රමාණයන් "ආ" තීරුවේ දක්වා ඇත. එය නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | තේ වගාව | A - | 2000mm - 2500mm |
| 2. | වී වගාව | B - | 1900mm - 5400mm |
| 3. | පොල් වගාව | C - | 1900mm වැඩි |
| 4. | රබර් වගාව | D - | 2000mm වැඩි |

(1) ABDC (2) BACD (3) CBAD (4) BCAD (............)

(20) පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ කිහිපයක් "අ" තීරුවේ සඳහන් වන අතර ඒවායේ පිහිටීම "ආ" තීරුවේ දක්වා ඇත. එය නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | මොංගෝලියානු සානුව | A - | දකුණු ඇමරිකා මහාද්වීපය |
| 2. | ඇන්ඩීස් කඳුවැටිය | B - | අප්‍රිකා මහාද්වීපය |
| 3. | නල්ලබාර් තැන්න | C - | ආසියා මහාද්වීපය |
| 4. | ඇට්ලස් කඳු | D - | ඕස්ට්‍රේලියා මහාද්වීපය |

(1) CADB (2) ABCD (3) BCDA (4) CABD (............)

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පිළිතුර යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(21) සියුවානු දූපත පිහිටා ඇත්තේ ........................................ සාගරයේ ය.

(22) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්තශාලාව ................................ ප්‍රදේශයේ පිහිටා ඇත.

(23) 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක වැව් බැම්ම, සමෝච්ච රේඛා දැක්වීම සඳහා .................................... වර්ණය භාවිත කරයි.

(24) ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකායෙන් ................%ක් කෘෂි අංශයේ රැකියාවල නිරත වේ.

(25) සිරංගව සම්පත් හුවමාරු කර ගැනීමේ මධ්‍යස්ථානය ........................................ ප්‍රදේශයේ පිහිටුවා තිබේ.

- ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න.




(26) වී වගාව පිළිබඳ විවිධ පර්යේෂණ සිදු කරන බතලගොඩ වී පර්යේෂණ ආයතනය දැක්වෙන්නේ ............ අක්ෂරයෙනි.

(27) ශ්‍රී ලංකාවේ උඩරට තේ වගා කරන දිස්ත්‍රික්කය ................ අක්ෂරයෙන් දැක්වේ.

(28) ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්කය .................... අක්ෂරයෙන් දැක්වේ.

(29) ශ්‍රී ලංකාවේ පර්ල් මුතු පර පිහිටි ප්‍රදේශය දැක්වෙනුයේ ......................... අක්ෂරයෙනි.

(30) ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය පිහිටා ඇති දිස්ත්‍රික්කය ......................... අක්ෂරයෙන් දැක්වේ.

- ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

(31) වර්ෂණය, උෂ්ණත්වය, පීඩනය , සුළං, ආර්ද්‍රතාව, වලාකුළු වර්ධනය වැනි සියලු කාලගුණ සිද්ධි ඇතිවන වායුගෝලීය ස්තරය වන්නේ,

(1) අපරවර්ති ගෝලය
(2) පරිවර්තීගෝලය
(3) මෙසෝගෝලය
(4) තාපගෝලය (..........)

(32) ශ්‍රී ලංකාව හා ඉන්දියාව පිහිටා ඇත්තේ,

(1) ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටියේ ය.
(2) අප්‍රිකානු භූ තැටියේ ය.
(3) යුරේසියානු භූ තැටියේ ය.
(4) කැරිබියානු භූ තැටියේ ය. (..........)

(33) කඳුකර බිම්වල වී වගාවේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) ජල ගැලීම් නිසා වගාවන්ට හානි සිදුවේ. (2) හෙල්මළු ක්‍රමයට වගා කෙරේ.

(3) යන්ත්‍ර සූත්‍ර භාවිතය බහුල ය. (4) ජල සම්පාදනයෙන් වගා කෙරේ. (..........)

(34) බොරැල්ලස්ගමුව, මීටියාගොඩ, රත්තොට ප්‍රදේශවල බහුලව ඇති මැටි වර්ගය

(1) බෝල මැටි (2) කිරි මැටි

(3) කෙඕලින් මැටි (4) උළු ගඩොල් මැටි (..........)

(35) ලෝකයේ විද්‍යුත් කර්මාන්තයේ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) චීනය හා ජපානය ප්‍රමුඛයන් ලෙස කටයුතු කරයි.

(2) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබේ.

(3) කර්මාන්තවල අයිතිය බහුජාතික සමාගම් සතු ය.

(4) මෙම කර්මාන්තය යටතේ විවිධ නිෂ්පාදන නොකරයි. (..........)

(36) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන ධාරිතාවට වැඩිම දායකත්වයක් දක්වා ඇති රට වන්නේ.

(1) චීනය (2) ජපානය (3) රුසියාව (4) ජර්මනිය (..........)

(37) ශ්‍රී ලංකාවේ පුරාණ නගර සංචාරක කලාපයට අයත් ප්‍රදේශයක් වන්නේ.

(1) යාපනය (2) දඹුල්ල (3) හම්බන්තොට (4) මඩකලපුව (..........)

(38) ශ්‍රී ලංකාවේ වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

(1) විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම

(2) විදේශිකයන් විසින් ආරම්භකර තිබීම

(3) විදේශ විනිමය ලබා දෙන අපනයන බෝග නොවීම

(4) පුහුණු ශ්‍රමය භාවිත වීම (..........)

(39) ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ,

(1) මහනුවර (2) මාතර (3) ලුණුවිල (4) කුරුණෑගල (..........)

(40) සම්පූර්ණයෙන් මුහුදින් වට වී ඇති මුහුදු පමණක් දැක්වෙන පිළිතුර

(1) රතු මුහුද , කැස්පියන් මුහුද (2) ඒරල් හා කැස්පියන් මුහුද

(3) බෝල්ටික් මුහුද හා චීන මුහුද (4) ජපන් මුහුද හා ඒරල් මුහුද (..........)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II

නම/විභාග අංකය :- .................................................. කාලය: පැය 02 යි.

- මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් 02කි.
- I කොටස අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඇ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

(01) (අ) (i) විවිධ භූගෝලීය තොරතුරු ඉතා ම නිවැරදිව සිතියම්ගත කිරීමට වර්තමානයේ භාවිත කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii)




ඉහත දැක්වෙන්නේ 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක ආකෘතියකි. එහි A, B, C තීරු නම් කරන්න. (ලකුණු 03)

(iii) භූ ලක්ෂණ සිතියමක ඇතුළත් වන විවිධ ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

(iv) 1 : 50 000 භූ ලක්ෂණ සිතියමේ රේඛීය පරිමාණය නිවැරදිව ඇඳ දක්වන්න. (ලකුණු 03)

(ආ) සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A, B හා C අක්ෂර අතරෙන් කපු වැඩි ම නිපදවන "ඊජිප්තුව" දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂර අතුරෙන් කිරි ගව පාලනය ව්‍යාප්ත වී ඇති "නෙදර්ලන්තය" දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා J අක්ෂර අතුරෙන් රබර් වගා කරන "මැලේසියාව" දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L හා M අක්ෂරවලින් දැක්වෙන රටවල් තුන අතරෙන් සහල් හා වානේ නිෂ්පාදනයට වැදගත් "මුසිලය" දක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R අක්ෂරවලින් දැක්වෙන දූපත් අතරින් අප්‍රිකා මහාද්වීපය තුළ පිහිටි මැඩගස්කරය දක්වෙන අක්ෂරය කුමක් ද?

(ආ) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඒ සඳහා ලෝක සිතියම යාබද ඇති සිරුව භාවිත කරන්න. (ලකුණු 05)




(i) A, B හා C යන අක්ෂර අතරින් "මයිලඩ්ඩි" ධීවර වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂර අතරින් බොලු මැටි නිධියක් පිහිටි "අම්පාර" දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා J අක්ෂර අතරින් "කලාඔය" දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L හා M යන අක්ෂර අතරින් වැඩිම බිම් ප්‍රමාණයක වී නිෂ්පාදනය කරන "කුරුණෑගල" දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) N, O හා P අක්ෂර අතරින් "කෙරවලපිටිය" තාප බලාගාරය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

## II කොටස

(02) (i) පෘථිවි පද්ධතිය සමන්විත වන උප පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවියේ ජලය ව්‍යාප්ත වී ඇති ආකාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ජල චක්‍රයේ ඕනෑම අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(b) ජල ගෝලයේ පැවැත්මට තර්ජනය වන මානුෂ ක්‍රියාවලි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(03) (i) "මහාද්වීප තටාකය" කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) පහත එක් එක් මහාද්වීප තටාකය තුළ පිහිටි දූපත් මොනවාදැයි වරහන තුළින් තෝරා ලියන්න.

(a) ආසියා - ______________ (b) ඕස්ට්‍රේලියා - ______________ (c) අප්‍රිකා -

(මැඩගස්කරය, බ්‍රිතාන්‍ය දූපත්, ජාවා, පැපුවා නිව්ගිනියා, ජැමෙයිකාව) (ලකුණු 03)

(iii) (a) ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) ඉන් එක් දේශගුණික කලාපයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

● පහත දැක්වෙන ලෝක ආකෘති සිතියම උපයෝගී කරගෙන 04 හා 05 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(04) (i) A හා B ලෙස දක්වා ඇති තිරිඟු වගා කරනු ලබන රටවල් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) තිරිඟු වගාවේ ව්‍යාප්තියට හේතු වී ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ආසියාවෙන් බැහැරව වී වගා කරනු ලබන ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(05) (i) ඉහත ලෝක සිතියමේ 1 හා 2 ලෙස දක්වා ඇති යකඩ හා වානේ නිෂ්පාදන ප්‍රදේශ දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ දෙකක් හා නව ප්‍රවණතා එකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත වන ගැටලු පහත ශීර්ෂ යටතේ කෙටියෙන් විස්තර කරන්න.

(a) අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු (b) ශ්‍රමය ආශ්‍රිත ගැටලු (c) වෙළෙඳපොළ ආශ්‍රිත ගැටලු (ලකුණු 06)

(06) (i) දී ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි

(a) තේ වගාවට වැදගත් දිස්ත්‍රික්කය ද,

(b) රබර් වගාවට වැදගත් දිස්ත්‍රික්කය ද, පිළිවෙළින් නම් කරන්න.

(ලකුණු 02)




(ii) රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න.

(ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාව සුළු අපනයන බෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට බලපා ඇති කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(07) (i) ලෝකයේ කිරිපට්ටි පාලනය කරනු ලබන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීමට බලපා ඇති කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)